# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,508 — 1958 අගෝස්තු 29 වැනි සිකුරාද — 29.8.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**නො. 50 දරණ ආහාර මිළ නියෝගය**

**අතිරේක ආහාර ද්‍රව්‍ය.**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

වවුනියා දිස්ත්‍රික්කයේ උප (ආහාර) මිළ පාලක තැන්පත් සෙල්ලප්පා සින්නතම්බි වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පවරා තිබෙන බල තල අනුව මේ නියෝගයෙන් —

(1) අද සිට පහත සඳහන් මිළ නියෝගයන් අවලංගු කරමි :—

(අ) 1958 ජූනි මස 25 වෙනි දින නො. 11,373 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 ජූනි 27 වෙනි දින නො. වී 47 දරණ ආහාර මිළ නියෝගයේ සඳහන් සියලුම ද්‍රව්‍යයන් (කරවල හැර) ;

(ආ) 1958 ජූලි මස 19 වෙනි දින නො. 11,432 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන-ලද 1958 ජූලි මස 17 වෙනි දින නො. 48 දරණ ආහාර මිළ නියෝගය ;

(ඉ) 11.8.58 දින නො. 11,472 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 අගෝස්තු මස 8 වෙනි දින නො. වී49 දරණ ආහාර මිළ නියෝගය.

(2) මීට යා කර ඇති උපලෙඛනවල 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක්ද, එම උපලෙඛනයේ සඳහන් ප්‍රදේශවල විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන් එම උපලෙඛනයේ 2 සිට 3 දක්වා තීරවල සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) පළමුවෙනි උප ලෙඛනයේ සඳහන් ප්‍රදේශවල, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් ද, මෙදැන් පටන් තාවකාලිකව නියම කරන ලද මිළ ගණන් අනුව දෙවැනි උපලෙඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශවල පළමුවෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් ද දෙවන උප ලෙඛනයේ 2 සහ 3 වන තීරයන්හි සඳහන් මිළ ගණන් එම ප්‍රදේශවල විකිණිය හැකි වැඩිම මිළ ගණන් වන්නේය.

(4) තවද මෙම නියෝගයන්ගේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සෑම වෙළඳාමක් සහ ඕනෑම ප්‍රමාණයක්, ඕනෑම ද්‍රව්‍යයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ රාත්තල් 28 න් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ කොයි අන්දමකට හෝ එක වරකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) රාත්තල් 28 කට අඩු ඕනෑම ප්‍රමාණයක විකිණීමක්, පරිභෝගය සඳහා විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද මෙම නියෝගයේ වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලෙඛනයේ 1 වන තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(6) තවද මෙම නියෝගයේ වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලෙඛනයේ 1 වන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුටම එම ප්‍රදේශය සඳහා උපලෙඛනයේ 1 වන තීරයේ සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

2505—ජේ. ඇන්. ආර් 25793—4693 (8/58)

(7) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවැරදූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(8) තවද මෙම නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලෙඛනයේ 1 වන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඉ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඊ) වෙළඳාමෙ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතුය.

(9) උපලෙඛනයේ 1 වන තීරයේ සඳහන් එම ද්‍රව්‍යයක් විකුණනු විට ඒ විකුණන ලබන ද්‍රව්‍යය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිලත් උපලෙඛනයේ 2 වන 3 වන තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1958 අගෝස්තු 25 වන දින සවස 3ට වවුනියාවේදී අත්සන් කරන ලදී.

ඇස්. සින්නතම්බී,
වවුනියා දිස්ත්‍රික්කයේ උප (ආහාර) මිළ පාලක තැන.

## පළමුවැනි උපලේඛනය

වවුනියාවේ දෙමළ ආදයම් පාළක නිළධාරිතැනගේ කොට්ඨාශයේ ආඩිකුලම, වවුනියාව, නොච්චිමොදයි, නෙදුන්කුලම්, පූදුකුලම්.

වවුනියාවේ සිංහල ආදයම් පාළක නිළධාරිතැනගේ කොට්ඨාශයේ මඩුකන්ද සහ ඉරට්පෙරියකුලම.

| | 1 වැනි තීරය<br>විස්තර | 2 වැනි තීරය<br>හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | රතුලූනු හැර අනිත් ලූනු වර්ග ... ... ... ... ... | 22 02 ... | 0 24 |
| 2. | කොත්තමල්ලි ... ... ... ... ... | 42 22 ... | 0 42 |
| 3. | සුදුදුරු ... ... ... ... ... | 121 94 ... | 1 22 |
| 4. | වියලි මිරිස් ... ... ... ... ... | 78 27 ... | 0 80 |
| 5. | මුංඇට ... ... ... ... ... | 47 37 ... | 0 47 |
| 6. | උළුඳු (පියලි නොකළ) ... ... ... ... ... | 49 16 ... | 0 50 |
| 7. | කඩල ... ... ... ... ... | 42 0 ... | 0 42 |
| 8. | කඩල පරිප්පු ... ... ... ... ... | 62 78 ... | 0 62 |
| 9. | රතුලූනු ... ... ... ... ... | 27 22 ... | 0 30 |
| 10. | අර්තාපල් ... ... ... ... ... | 31 40 ... | 0 33 |
| 11. | උම්බලකඩ ... ... ... ... ... | 253 10 ... | 2 50 |
| 12. | අබ ... ... ... ... ... | 73 08 ... | 0 72 |

## දෙවැනි උපලේඛනය

| | 1 වැනි තීරය<br>කොට්ඨාශය | 2 වැනි තීරය<br>හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට දෙවැනි ලේඛනයේ සඳහන් මිළ ගණන් වලට පහත සඳහන් මිළ ගණන් එකතු විය යුතුය<br>රු: ශ. | 3 වැනි තීරය<br>රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට දෙවැනි ලේඛනයේ සඳහන් මිළ ගණන් වලට පහත සඳහන් මිළ ගණන් එකතු විය යුතුය<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | ආදයම් පාළක දිස්ත්‍රික්කය (දෙමළ)—මරුදන්කුලම්, මරුදමඩු, රාසෙන්ද්‍රන්කුලම<br>ආදයම් පාළක දිස්ත්‍රික්කය (සිංහල)—මරදමඩුව හැර සුදුවැන්දපුලව් සහ උළුකුලම | 0 25 ... | 0 01 |
| 2. | ආදයම් පාළක දිස්ත්‍රික්කය (දෙමළ)—පෙරියපුලියන්කුලම, වාකෙයිකඩිනාඕලුකුලම්, වලයිවඩිතාලකුලම් සහ සිංහළ ආදයම් පාළක දිස්ත්‍රික්කයේ උළුකුලම කොට්ඨාශයේ මරදමඩුව | 0 50 ... | 0 01 |
| 3. | වවුනියාව උතුර ආදයම්පාළක දිස්ත්‍රික්කයේ නෙදුන්කර්නි, මාන්කුලම්, ඔලුමඩු කනගරායන්කුලම් සහ පුලියන්කුලම් | 0 50 ... | 0 01 |
| 4. | වවුනියාව උතුර ආදයම් පාළක දිස්ත්‍රික්කයේ පරන්තන්, මනවලන්පද්දමුරිප්පු තන්ඩුවන්, කවලාමඩු, දන්වල්කොඩි | 0 75 ... | 0 02 |
| 5. | වවුනියාව, මුහුදුබඩ ප්‍රදේශයේ ආදයම් පාළක දිස්ත්‍රික්කයේ මුල්ලියවලෙයි, තන්නියූත්තු, මුලතිව්, වලයිමුල්ලියවයිකාල් | 1 00 ... | 0 02 |
| 6. | මුහුදුබඩ ප්‍රදේශය ආදයම් පාළක දිස්ත්‍රික්කයේ කුමුලමුනෙයි, පුදුකුඩුයිරිප්පු, අම්බලවන් පොක්කායි | 1 25 ... | 0 02 |
| 7. | මුහුදුබඩ ප්‍රදේශය ආදයම පාළක දිස්ත්‍රික්කයේ කෝකිලායි සහ කොක්කු තොඩුවායි ... | 1 50 ... | 0 03 |

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.